

| (අක්කරයට කි.ග්‍රෑ) | යූරියා | TSP ටීඑස්පී | MOP එම්ඕපී | සින්ක් සල්ෆේට් |
|---|---|---|---|---|
| 'මූලික යෙදුම | 05 | 45 | 15 | 02 |
| 1 මතුපිට-සති2 | 35 | - | - | - |
| 2 මතුපිට-සති5-6 | 55 | - | - | - |
| 3 මතුපිට-සති7-8 (මාස 4 ප්‍රභේද සඳහා 3වන මතුපිට සති 8 දී) | 30 | - | 20 | - |
| මුළු ප්‍රමාණය | 125 | 45 | 35 | 02 |

## වල්පැල පාලනය හා ඒකාබද්ධ පළිබෝධ පාලනය

- ඒකාබද්ධ වල් පැල පාලන ක්‍රම භාවිතා කරන්න.
- තෘණ වර්ගයේ වල් පැලවල කොළ දෙකේ අවස්ථාවේදී (දින 7-10) 3,4, DPA (36) ලීටර් 3 අක්කරයට යොදන්න.



- පන් හා පළල් පත්‍ර සඳහා වපුරා දින 21 ට පසුව MCPA 40 මිලී. 400 බෝතල් 02 ක් යොදන්න.
- 3,4 DPA හා MCPA කිසිවිටක කවලම් කර යොදන්න එපා. එයින් ගොයමට හානි ගෙන දේ.
- බිස්පයිරිබැක් සෝඩියම් (නොමිනි) (මි.ලී. 120ක් වපුරා දින7-14කදී) හෝ ප්‍රොපනිල්+පෙන්ට්‍රසමයිඩ් (ලෙක්ස්ප්‍රෝ) (කි. ග්‍රෑ. 1.2 ක් වපුරා දින 5-8 කදී) වැනි වල් නාශක සියළුම වල් වගී මර්දනය සඳහා යෙදිය හැක.

### *ඒකාබද්ධ පලිබෝධ පාලනය*

- ඉහත සඳහන් කල වගා ක්‍රම අනුගමනයෙන් ඒකාබද්ධ පළිබෝධ පාලන පිළිවෙත් බොහොමයක් සම්පූර්ණ වේ.
- අනවශ්‍ය ලෙස කෘමි නාශක නොයොදන්න.
- වගාව සතිපතා විමසිලිමත්ව පරීක්ෂා කර බලන්න. හිතකර සහ හානිකර කෘමින්ගේ වර්ධනය ගැන විමසිලිමත් වන්න.
- නියරේ සිට නොව කුඹුරට බැස වගාව බලන්න.
- අවශ්‍ය නම් පමණක් කෘමියා හඳුනා ගෙන නිර්දේශිත කෘමි නාශක යොදන්න.

*ඉහත වගා ක්‍රම අනුගමනයෙන් යහපත් වගා පරිසරයකදී අක්කරයට බුසල් 200 ක අස්වැන්නක් ලබාගත හැක ....*

**මෙය ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීමට පිළියල කරන ලදී.**



# අක්කරයට

# වී බුසල් 200 ක්

හිතකර වගා පරිසර වලදී අක්කරයට වී බුසල් 200 ක අස්වැන්නක් ලබා ගැනීමේ තාක්ෂණය

- කන්නයට වගා කිරීම
- හොඳින් බිම් සකස් කිරීම
- පාංශු පෝෂකත්වය දියුණු කිරීම
- ගුනාත්මක බිත්තර වී භාවිතය
- වල්පැල පාලනය හා ඒකාබද්ධ පළිබෝධ පාලනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
කෘෂිකර්ම හා වන සම්පත් අමාත්‍යාංශය.

## කන්නයට වගා කිරීම

**නියමිත කන්නයට හා යායේ සියළු දෙනාම එකට වගා කිරීම වැදගත් වේ.**

- නියමිත කන්නයට වගාව ආරම්භය

මහ කන්නයේදී

මාස 4 - නොවැ. 01-15 අතර

මාස 3½ - නොවැ. 15-30 අතර

යල කන්නයේදී

මාස 3½ - මැයි 01-15 අතර

මාස 3 - මැයි 15-30 අතර

- යායේ සියලු දෙනාම එකමුතුව දින 5-7 ඇතුලත වගාව ආරම්භ කිරීම.

## හොඳින් බිම් සකස් කිරීම

- පළමු සැකසුම අඩුම වශයෙන් වැපිරීමට දින 21 කට ප්‍රථම ආරම්භ කරන්න.
- පළමු බිම් සැකසුම අඟල් 8-10 ගැඹුරට සීසාන්න. මේ සඳහා යකඩ නඟුල, මෝල්ඩ් බෝල්ඩ් නඟුල, ඩිස්ක් නඟුල භාවිතා කරන්න.
- පස හොඳින් පෙරලා ජලය බැඳ වල් කුණුවීමට ඉඩ හරින්න.
- අධික වල් ඇති කුඹුරු වලට "පැරකොට් හෝ ග්ලයිෆොසෙට්" වැනි වල් නාශකයක් බිම් සකස් කිරීමට පෙර අවශ්‍ය නම් යොදන්න.
- දෙවන බිම් සැකසුම හා, මට්ටම් කිරීම නියර බැඳීම හොඳින් කරන්න.
- ගොවි ලැල්ල භාවිතයට පෙර මූලික පොහොර යොදන්න.

## උචිත ප්‍රභේදයේ උසස් බිත්තර වී වලින් ප්‍රශස්ථ පැල ගහනය පවත්වා ගැනීම

පහත සඳහන් ප්‍රභේද වැඩි අස්වැන්නක් ලබාදේ.

මාස 4 - බීජී. 379-2, බීජී.403, ඒ.ටී. 402

මාස 3½ - බීජී.358, බීජී.357, ඒ.ටී.353, ඒ.ටී. 354, බීජී.352, බීජී.94-1, බීඩබ්.351, බීජී.350

මාස 3 - බීජී 300, බීජී. 304, ඒටී. 303

**කවලම් නොමැති, 80% කට වඩා පැල වෙන, වල් පැල බීජ වලින් තොර ගුණාත්මක බීජ භාවිතා කරන්න.**

- ගුණාත්මක බිත්තර වී අක්කරයට බුසල් 2½ -3 වැපිරීමට භාවිතා කරන්න.
- නැතහොත් අහඹුව අඟල් 4×4 හෝ 4×6 පරතරයට පැල සිටුවන්න.

## පාංශු පෝෂකත්වය දියුණු කිරීම

**වැඩි අස්වැන්නක් සඳහා ප්‍රමාණවත් තරම් කාබනික පොහොර සහ නිර්දේශිත රසායනික පොහොර අත්‍යාවශ්‍යයයි.**



කාබනික පොහොර



- කුඹුරේ ඉහත කන්නයේ සම්පූර්ණ පිදුරු ප්‍රමාණය පළමු හීයට පෙර හෝ පසුව යොදන්න. (අක්කරයට ටොන් 2-2½ ක්)
- කොළ පොහොර කිලෝ ග්‍රෑම් 30 ප්‍රමාණයේ අතු මිටි 30-40 යොදන්න. (පළමු හීයට පසුව)
- හොඳින් දිරන ලද ගොම පොහොර (අක්කරයකට ටොන් 2ක්) දෙවන හීයට පසුව මට්ටම් කරන අවස්ථාවේදී කි.ග්‍රෑ.25 මළු 80 පමණ යොදන්න.
- ගොම පොහොර නැතිනම් කුකුලු පොහොර ටොන් 1ක් පමණ යොදන්න.
- අඟුරු කරන ලද දහයියා අක්කරයකට කිලෝ ග්‍රෑම් 250 ක් පමණ යොදන්න.
- කාබනික පොහොර යෙදූ පසු කුඹුර වියලීමට නොදී වතුර බැඳ තබන්න.

